**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2020 මාර්තු 27** | **චක්‍රලේඛය** | **2020 අංක 05**

## කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං-රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50ක සය-මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම

**1. හැඳින්වීම**

(i) කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං-රැකියා ඇතුළු ව්‍යාපාර සඳහා පුළුල් ෆිස්කල් හා මූල්‍ය සහන සැපයීමේ අරමුණින් කැබිනට් මණ්ඩලය විසින් 2020.03.20 වැනි දින ගන්නා ලද තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත ප්‍රතිමූල්‍ය පහසුකම ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම සහන අතරට ණය සහන කාලයක් (ප්‍රාග්ධනය හා පොළිය) සහ සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සඳහා 4% පොලී අනුපාතයකට කාරක ප්‍රාග්ධන පහසුකම් සැපයීම අයත්වේ.

(ii) 2020.03.25 වැනි දින සිට ක්‍රියාත්මක වන මෙම කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං-රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට ලබා දෙනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකමට සහභාගීවීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් (මින් ඉදිරියට මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) සුදුසුකම් ලබනු ඇත.

(iii) මෙම චක්‍රලේඛය, 2020.03.24 වන දින නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛයට අතිරේකයක් වන අතර මෙමගින් ඉහත ප්‍රතිමූල්‍ය පහසුකම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මෙහෙයුම් මාර්ගෝපදේශ සපයනු ලැබේ.

**2. මූල්‍ය පහසුකම් සඳහා අදාළ පොදු කොන්දේසි හා නියමයන්**

(i) සුදුසුකම් ලබන ව්‍යාපාර/ක්ෂේත්‍ර

(අ) සංචාරක, කොවිඩ්-19 නිසා වැඩ කටයුතු අඩාල වූ සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් (lockdowns) නිසා අගතියට පත් ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි හා මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) ඇතුළු අපනයන ආශ්‍රිත සෘජු හා වක්‍ර ව්‍යාපාර.

(ආ) රුපියල් බිලියනයට අඩු පිරිවැටුම් සහිත නිෂ්පාදන, සේවා, කෘෂිකාර්මික (සැකැසුම් කර්මාන්ත ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතුකිරීම් හා අවසරලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්

(ඈ) කොවිඩ්-19 වසංගතය නිසා තම රැකියා හෝ ආදායම් අහිමි වූ ස්වයං-රැකියා ව්‍යාපාර හෝ පුද්ගලයන්.

(ඇ) කොවිඩ්-19 වසංගතය නිසා තම ආදායම හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බලපෑම් එල්ලවූ, විදේශ මුදලින් ණය ගෙවීමට ඇති විදේශ විනිමය උපයන පුද්ගලයින් හා ව්‍යාපාර.

(ii) මෙම ප්‍රතිමූල්‍ය පහසුකම ඖෂධ, වෛද්‍යෝපකරණ, ආහාර, පොහොර, අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ හැරුනුකොට වෙනත් කිසිදු ආනයන ණය පහසුකමක් සඳහා යොදගත නොහැකි බව සැක හැර දත යුතුය.

(iii) දී ඇති කොන්දේසි අවශ්‍යතාවයන්ට යටත් ව රුපියල් හා විදේශ මුදලින් ලබාගත් කාලීන ණය, කල් බදු, රන් භාණ්ඩ උකස් ණය පහසුකම්, අයිරා සහ වෙළඳ මූල්‍ය පහසුකම් සඳහා මෙම මූල්‍ය ක්‍රමය යටතේ පහසුකම් ලැබෙනු ඇත.

(iv) අන්තර්ජාල පහසුකම් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ සහන අපේක්ෂා කරන බවට 2020.04.30 දිනට ප්‍රථම ඉල්ලීම් කල, කොවිඩ්-19 වසංගතය නිසා වැඩ කටයුතු අඩාල වූ සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් නිසා අගතියට පත්, සියළු ණය ගැනුම්කරුවන් සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ අදාළ සහන ලබාදීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කල යුතුය. ගනුදෙනුකරුවන් මෙවැනි ඉල්ලීමක් සිදුකල දින සිට දින 45ක් තුලදී අදාළ ඉල්ලීම ඇගයීමට ලක්කිරීම සම්පූර්ණ කිරීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කල යුතු අතර, එසේ ඇගයීම සිදුකර අවසන් කරන තෙක් අදාළ අයදුම්කරුවන්ගේ ණය පහසුකම් නැවත අයකර ගැනීම නැවැත්විය යුතුය.

**3. 2020.03.25 දින වන විට සක්‍රියව පැවති ණය සඳහා ලැබෙන සහන**

(i) 2020.04.30 වන දින හෝ ඊට ප්‍රථම මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ඉල්ලා සිටින ණය ගැනුම් කරුවන්ගේ සුදුසුකම් ලබන සියළු රුපියල් හා විදේශ මුදල් කාලීන ණය සඳහා පහත සඳහන් කාල සීමාවන් සඳහා ණය ගෙවීමේ සහන කාලයක් මූල්‍ය ආයතන විසින් ලබාදිය යුතුය.

(අ) ස්වයං-රැකියා නියුක්තිකයන්/ හිමිකරුවන් විසින් ක්‍රියාත්මක කරන සියළු ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන වෑන් රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගන්නා කුඩා රථ, බස් රථ සහ අනෙකුත් වත්කම් වන යතුරුපැදි හා කුලී රථ වල කල්බදු වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක්.

(ආ) පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින් විසින් ලබා ගත් පුද්ගල ණය ගෙවීම සඳහා 2020.05.30 දක්වා සහන කාලයක්.

(ඇ) රුපියල් මිලියනයට අඩු වටිනාකමකින් ප්‍රදානය කල සියළුම පුද්ගල ණය සහ කල්බදු වාරික සඳහා මාස තුනක සහන කාලයක්.

(ඈ) අගතියට පත් ව්‍යාපාරික අංශයන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට, සංචාරක, ඇඟළුම්, වැවිළි, තොරතුරු තාක්ෂණ සහ සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) සඳහා මාස හයක ණය සහන කාලයක්.

(ඉ) ඉහත 2(i) යටතේ සඳහන් අනෙකුත් සියළුම සුදුසුකම් ලත් ව්‍යාපාර/ක්ෂේත්‍ර සඳහා මාස හයක ණය සහන කාලයක්.

(ii) මූල්‍ය ආයතන විසින් ණය සහන සඳහා සුදුසුකම් ලබන ණය පහසුකම්වල ආපසු ගෙවීමේ කාලසීමාව අදාළ ණය සහන කාලසීමාවෙන් දීර්ඝ කල යුතුය.

(iii) 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන ස්ථාවර අයිරා පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කරනු ඇත. කෙසේ නමුත්, සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන්ගේ, 2020.03.25 දින වන විට පැවැති තාවකාලික අයිරා පහසුකම් වල කල් පිරීම් මාස දෙකකින් දීර්ඝ කෙරෙන අතර එකී පහසුකම් සඳහා දීර්ඝ කරන ලද කාලසීමාව තුල අයකල හැකි පොලී අනුපාතය 13% ක උපරිමයකට සීමා කෙරේ.

(iv) 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන සුදුසුකම් ලත් වෙළඳ ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කෙරේ.

(v) 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන උකස් ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කෙරේ.

**4. 2020.03.25 දින වන විට අක්‍රියව පැවති ණය සඳහා ලැබෙන සහන**

(i) 2020.03.25 දක්වා අයවිය යුතු දඩ පොලී අදාළ මූල්‍ය ආයතනය විසින් අහෝසිකල යුතුය.

(ii) ණය සහ අත්තිකාරම් ප්‍රතිලේඛණගත කිරීම පහත පරිදි සිදුකල යුතුය:

(අ) මුල් ණය මුදලින් 50% ක් හෝ ඊට වැඩි මුදලක් ණය ගැනුම්කරු විසින් ආපසු ගෙවා ඇති අවස්ථාවකදී මෙම ප්‍රතිමූල්‍යා පහසුකම යටතේ අදාළ මූල්‍යා ආයතනය විසින් සලකා බලන දිනය දක්වා වන හිඟ පැවැති වාරික සඳහා අදාළ නොගෙවූ හා එකතු වූ පොලියෙන් (ඉහත සඳහන් කල පරිදි දඩ පොලී අහෝසි කිරීමෙන් පසු) 50% ක් කල් දැමීම කල හැක. ගෙවිය යුතු ප්‍රාග්ධන මුදලෙහි ශේෂය ද පැහැර හරින ලද වාරික සඳහා ගෙවිය යුතු පොළියේ ඉතිරිව ඇති ශේෂය සහ ඉදිරියට ගෙවීමට ඇති පොළිය වසර තුනක කාලයකින් දීර්ඝ කර ප්‍රතිලේඛණගත කළ යුතුය. එලෙස ප්‍රතිලේඛණගත කළ ණය මුදල් ණය ගැනුම්කරු විසින් පහත සඳහන් ඡේද (ඇ) සහ (ඈ) හි සඳහන් ආකාරයට ගෙවීමෙන් අනතුරුව මූල්‍යා ආයතනය මගින් කල් තබන ලද පොලී මුදල් අහෝසි කිරීමට කටයුතු කල යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මුළු ණය මුදලින් 50% කට අඩුවෙන් ආපසු ගෙවා ඇති අවස්ථාවකදී මෙම ප්‍රතිමූල්‍යා පහසුකම යටතේ අදාළ මූල්‍යා ආයතනය විසින් සලකා බලන දිනය දක්වා වන හිඟ පැවැති වාරික සඳහා අදාළ නොගෙවූ හා එකතු වූ පොළියෙන් (ඉහත සඳහන් කල පරිදි දඩ පොලී අහෝසි කිරීමෙන් පසු) 25% ක් කල් දැමීම කල හැක. ගෙවිය යුතු ප්‍රාග්ධන මුදලෙහි ශේෂය ද පැහැර හරින ලද වාරික සඳහා ගෙවිය යුතු පොළියේ ශේෂය සහ ඉදිරියට ගෙවීමට ඇති පොළිය වසර තුනක කාලයකින් දීර්ඝ කර ප්‍රතිලේඛණගත කළ යුතුය. එලෙස ප්‍රතිලේඛණගත කරන ලද ණය මුදල් ණය ගැනුම්කරු විසින් පහත සඳහන් ඡේද (ඇ) සහ (ඈ) හි සඳහන් ආකාරයට ගෙවීමෙන් අනතුරුව මූල්‍යා ආයතනය මගින් කල් තබන ලද පොලී මුදල් ද අහෝසි කිරීමට කටයුතු කල යුතුය.

(ඇ) ඉහත ඡේද (අ) සහ (ආ) සඳහන් ආකාරයට ගෙවිය යුතු ප්‍රාග්ධන ශේෂය යලි සකසා වසර තුනක් තුල දී ආපසු ගෙවිය යුතුය.

(ඈ) ඉහත (අ) හා (ආ) හි සඳහන් කල පැහැර හැරි ණය වාරික වලට අදාළ ඉතිරි පොලිය හා ඉදිරියට ගෙවිය යුතු පොලිය අවිනිශ්චිත ගිණුමකට මාරු කල යුතු අතර එය අවුරුදු 3ක් තුල ආපසු ගෙවිය යුතුය.

(ඉ) 2020.09.30 දින දක්වා ණය ආපසු ගෙවීමට සහන කාලයක් ලබාදිය යුතුය.

(ඊ) ණය ආපසු ගෙවීමේ සහන කාලය තුල ණය ගැනුම්කරු විසින් අඛණ්ඩව මාස 6ක් පොලිය ගෙවා ඇති විටෙක, අවශ්‍ය නම්, බලපත්‍රලාභී බැංකු හට මෙම යෝජනා ක්‍රමය යටතේ අක්‍රිය ලෙස සලකා ඇති ණය, සක්‍රිය ණය හා අත්තිකාරම් ලෙස නැවත වර්ගීකරණය කල හැක.

කෙසේ වෙතත්, අදාළ අක්‍රිය ණය පහසුකම ප්‍රතිලේඛණගත කිරීමට සැලකීමට පෙර හිඟ පැවැති වාරික ගණන මාස හයට අඩු නම්, එම හිඟ පැවැති වාරික ගණනේ පොලියට සමාන ප්‍රමාණයක් ණය ගැනුම්කරු විසින් ගෙවූ පසු පමණක් අදාළ ණය පහසුකම සක්‍රිය කාණ්ඩයට වර්ගීකරණය කල හැක.

(iii) ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම

(අ) මෙම චක්‍රලේඛය නිකුත් වන දිනය වන විට අක්‍රිය කාණ්ඩයේ පැවැති, සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන විසින් 1990 අංක 4 දරණ බැංකු විසින් ණය ආපසු අය කරගැනීමේ (විශේෂ ප්‍රතිපාදන) පනත, 1949 අංක 6 දරණ සංශෝධිත උකස් පනත හෝ 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත යටතේ අත්පත් කරගැනීමේ ක්‍රියාමාර්ග අරඹා හෝ ඒ පිළිබඳ නිවේදන නිකුත් කර ඇතිනම්, එම අත්පත් කරගැනීමේ ක්‍රියාමාර්ග, එකී ගනුදෙනුකරු විසින් අදාළ මූල්‍ය ආයතනය හා ණය ආපසු ගෙවීම පිළිබඳ එකඟතාවයකට පැමිණීමේ කොන්දේසිය මත අත්හිටුවනු ඇත.

(ආ) මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනත් ප්‍රකාරව වත්කම් අත්පත් කරගැනීම සඳහා නව යෝජනා සම්මත කරගැනීම කල් දැමිය යුතුය. එසේ අත්පත් කරගැනීම් සඳහා මේ වන විටත් යෝජනා සම්මත වී ඇති, මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන ණය ගනුදෙනුකරුවන්ගේ වත්කම් වෙන්දේසි කිරීම 2020.09.30 දක්වා අත්හිටුවිය යුතුය.

(ඇ) ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින ණය ගැනුම්කරුවන් හට මෙම යෝජනා ක්‍රමයේ සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් එකඟවන බවට දිවුරුම් ප්‍රකාශයක් අධිකරණයට ඉදිරිපත් කර ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීමට අවසර ඇත.

(ඈ) මෙම යෝජනා ක්‍රමය යටතේ පිළිගෙන ඇති අක්‍රිය කාණ්ඩයේ සිටින ණය ගැනුම් කරුවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සියළුම මූල්‍ය ආයතන විසින් අත්හිටුවිය යුතුය.

**5. නව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන කටයුතු සඳහා ලබා දෙන ණය**

(i) ණය ගැනුම්කරුවන් විසින් පිළිගත හැකි ව්‍යාපාර සැලැස්මක් ලබා දෙන්නේ නම්, පහත කොන්දේසි වලට යටත්ව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන කටයුතු සඳහා දේශීය මුදලින් අමතර ණයක් හෝ නව ණය පහසුකමක් ලබාදීමට මූල්‍යායතන හට හැකියාව ඇත.

(අ) සුදුසුකම් ලබන සක්‍රීය හා අක්‍රීය කාණ්ඩයේ ගනුදෙනුකරුවන් හට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එක් ගනුදෙනුකරුවෙකු හට එක් බැංකුවකින් රුපියල් මිලියන 25 ක් හෝ අනෙකුත් මූල්‍ය ආයතන සඳහා එක් ගනුදෙනුකරුවෙකුට එක් ආයතනයකින් රුපියල් මිලියන 10 හෝ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය යන දෙකෙන් වැඩි අගය නොඉක්මවන වටිනාකමක රුපියල් ණය මුදලක්, ඒවායේ කාරක ප්‍රාග්ධන චක්‍රයන්ගේ අවශ්‍යතාව සලකා බලා ලබා දිය හැක. මෙකී ණය මුදල් 4% කට සමාන වාර්ෂික පොලී අනුපාතිකයකින් වසර දෙකක් තුල ගෙවෙන ලෙස ලබාදිය යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා 4% දක්වාත් අනෙකුත් මූල්‍ය ආයතන සඳහා 7% දක්වාත් පොලී පිරිවැය ප්‍රතිදානය (rebate) කරනු ඇත.

(ආ) ආයෝජන කටයුතු සඳහා ණය පහසුකම් ලබා දිය හැක්කේ බලපත්‍රලාභී බැංකු මගින් පමණක් වන අතර සක්‍රීය කාණ්ඩයේ ගනුදෙනුකරුවන් සඳහා පමණක් එක් ගනුදෙනුකරුවෙකුට එක් බැංකුවකින් තම ව්‍යාපාර කටයුතු පුළුල් කරගැනීම සඳහා රුපියල් මිලියන 300කට නොවැඩි වටිනාකමක රුපියල් ණය මුදලක් ලබා දිය හැක. එවැනි ණය පහසුකම් වසර පහක කාලයක් තුලදී ගෙවීයන සේ ලබාදිය යුතු අතර අයකල හැකි උපරිම පොලී අනුපාතය බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය (AWPLR) + 1.5% නොඉක්මවිය යුතුය.

(ii) මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන්ගේ අරමුදල් අවශ්‍යතාව මනාව ඇගයීමෙන් අනතුරුව ප්‍රදානය කරන ණය මුදලේ ප්‍රමාණය පිළිබඳව එකඟතාවයකට පැමිණිය යුතුය.

(iii) කාරක ප්‍රාග්ධන හා ආයෝජන ණය යන දෙවර්ගයේම ණය සඳහා 2020.03.25 සිට 2020.09.30 දක්වා කාල සීමාව තුල ආපසු ගෙවීම් සඳහා සහන කාලයක් හිමිවේ.

(iv) මූල්‍ය ආයතන විසින් මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ ලබා දෙනු ලබන කිසියම් හෝ අමතර ණය පහසුකම් වලට අදාළ අවදානම මගහරවා ගැනීම සඳහා සුදුසු ඇපකරයක් ලබාගත හැක.

**6. බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රමය යටතේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම**

බලපත්‍රලාභී බැංකු වෙත ලබා දී ඇති ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රමයන්ගේ 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා අය වීමට නියමිත ප්‍රාග්ධන ආපසු ගෙවීම් කල් දැමීමට රජය විසින් කැමැත්ත පලකර ඇති අතර එවැනි දිගුවන් අවශ්‍ය බැංකු හට ඒ සඳහා ඉල්ලීමක් කල යුතු අතර අදාළ රාජ්‍ය ආයතන සමඟ අතිරේක ගිවිසුම් වලට එළඹීමට ද අවශ්‍ය වේ.

**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2020 මාර්තු 27** **චක්‍රලේඛය** **2020 අංක 05**

---

**7. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්**

(i) මූල්‍ය ආයතන විසින් හුදෙක් අසතුටුදායක ණය වාර්තා මත පමණක් පදනම්ව ණය අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් පවත්වාගත යුතුය.

(ii) මූල්‍ය ආයතන විසින් ණය තොරතුරු කාර්යාංශයේ උපදෙස් ද ලබා ගනිමින්, මෙම යෝජනා ක්‍රමය යටතේ සක්‍රිය ණය ගැනුම්කරුවන් විසින් ප්‍රාග්ධන ගෙවීම් කල්දැමීම සම්බන්ධව වාර්තා කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස්කල යුතු අතර, එමගින් මෙම යෝජනාක්‍රමයට සම්බන්ධවන සක්‍රිය ණය ගැනුම් කරුවන්ට ඉදිරියේදී ඔවුන්ගේ ණය ශ්‍රේණියේ හෝ ණය තොරතුරු කාර්යාංශ වාර්තාවන්ට අහිතකර ලෙස බලපෑමක් සිදුවීම වැලැක්විය යුතුය.

**8.** මූල්‍ය ආයතන විසින් චෙක්පත් අගරු වීම්, ගෙවීම් නැවැත්වීම් සඳහා අයකිරීම්, සියළු ණය කාඩ්පත් හා අනෙකුත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම් 2020.09.30 දක්වා කාලසීමාව තුල අත්හිට විය යුතුය.

**9. වාර්තාකරණ අවශ්‍යතාවන්**

මූල්‍ය ආයතන විසින් සිය ණය ගැනුම්කරුවන් විසින් ලබා ගන්නා ලද ණය සහන කාලයන් පිළිබඳ තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට/බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2020.05.01 දින සිට සෑම මසකම 15 සහ 30 වැනි දින වන විට පැවැති තත්ත්වය වැඩකරන දින 5ක් තුල දී වාර්තාකල යුතුය.

අත්සන් කලේ,

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති